මගේ අංකය NITF/WEB PORTAL/2021-04 2022/09/01

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රාජ්‍ය නිළධාරීන් සඳහා වූ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය (අග්‍රහාර) - දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ NITF/WEB PORTAL/2021-04 අංක දරණ ලිපිය හා බැඳෙ. එමගින් සියලුම අග්‍රහාර සාමාජිකයින් හා ඔවුන්ගේ ප්‍රතිලාභ ලබන්නන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීමේ කාලීන අවශ්‍යතාවය පිළිබඳව ඔබ දැනුවත් කර ඇති අතර යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

02. අග්‍රහාර දත්ත පද්ධතිය විශ්ලේෂණය කිරීමේදී බොහෝ ආයතනවල නිළධාරීන්ගේ දත්ත මේ වන විටත් පූර්ණ ලෙස යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය වේ. ඔබ ආයතනයේ දත්ත යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය කෙරෙහි අවධානය යොමු කර, 2022 සැප්තැම්බර් මස 30 වන දිනට පෙර පූර්ණ වශයෙන් දත්ත යාවත්කාලීන කිරීමට අග්‍රහාර සාමාජික නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. අපගේ වෙබ් අඩවියට (www.nitf.lk) පිවිස, යාවත්කාලීන කල යුතු ආකාරය පිළිබඳ උපදෙස් මාලාව ඇතුලත් අත්පොත, විඩියෝව පරිශීලනය කිරීමෙන් මේ පිළිබඳ වැඩි විස්තර ලබාගත හැකිය.

- දත්ත යාවත්කාලීන කිරීමේ දී අදාල සමාජිකයාට සමාජික ගොනුව තුලින් (MEMBER LOGIN) තමාගේ විස්තර යාවත්කාලීන කල හැක.
- අලුතින් දත්ත ඇතුලත් කිරීමේ දී පරිපාලන කටයුතුභාර නිළධාරියා විසින් අදාල අග්‍රහාර සාමාජිකයාගේ දත්ත ඇතුලත් කළ යුතුය.
- ඇතුලත් කළ සියලුම දත්ත ආයතන ප්‍රධානියා විසින් අනුමත කිරීමෙන් යාවත්කාලීන කිරීමේ කාර්යය සම්පූර්ණ වේ.(ඒ සඳහා රහස් අංකයන් ඉහත ලිපිය සමග ලබා දී ඇත.)

ඉදිරියේදී අග්‍රහාර රක්ෂණ හිමිකම් සම්බන්ධ සියලු කටයුතු මාර්ගගත ක්‍රමයට (Online method) සිදුකරන බැවින්, නිවැරදි දත්ත යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වන බව දැනුම් දෙමි.

වැඩිදුර පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් දුරකථන අංක 0112-026662 / 0112-026650

/ 0112-026651 අමතන ලෙස ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කරමි.

ගමානි එන්. ලියනාරච්චි
ප්‍රධාන විධායක නිළධාරි
ජාතික රක්ෂණ භාර අරමුදල